සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:
- I හා II යන කොටස්වලින් මෙම පත්‍රය සමන්විත වේ.
- I කොටසේ සියළුම ප්‍රශ්නවලට හා II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරුපත් එකට ගැටගසා භාර දෙන්න. I හා II ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාලව නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) වචන භාවිතයෙන් තොරව මිනිස් සිරුර උපයෝගී කරගෙන කිසියම් සිද්ධියක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) අනුරූපණය නමිනි. (2) අනුකරණය නමිනි.
(3) අභිරූපණය නමිනි. (4) සමාරෝපය යනුවෙනි.

(02) නම්පොත භාවිතයෙන් වර්ධනය කරගත හැකි රංගන හැකියාව වන්නේ,
(1) පෙළ රචනයයි. (2) රිද්මයානුකූල රංගනයයි.
(3) සකන්දර ගෙතීමයි. (4) උච්චාරණ හැකියාවයි.

(03) යම්කිසි නාට්‍යයක කථා වස්තුවෙන් ප්‍රකාශ කරන අදහස හැඳින්විය හැක්කේ,
(1) නාට්‍යයේ රිද්මය යනුවෙනි (2) නාට්‍යයේ තේමාව යනුවෙනි.
(3) නාට්‍යයක ශෛලියයි. (4) නාට්‍ය දෘෂ්ටියයි.

(04) චිත්‍ර සටහන් කැමරාවක් මගින් රූගත කරනු ලබන මාධ්‍යයකි.
(1) සිනමාව (2) ටෙලි නාට්‍යය (3) කාටූන් (4) රූකඩ

(05) ශිථිලකරණය යන්නෙන් අදහස් කරන්නේ,
(1) ශරීරය උණුසුම් කිරීමයි.
(2) ශරීරය සැහැල්ලු කිරීමයි.
(3) වචන භාවිතා නොකර හැඟීම් ප්‍රකාශ කිරීමයි.
(4) හඬ උච්චාරණ අභ්‍යාසයයි.

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.

(06) වේදිකාවේ දකින ආලෝකය, වේශභූෂණ, හඬ සංගීතය ආදිය .................................. අංග ලෙස හැඳින්වේ.

(07) නාට්‍යයක ගීත ගායනා කිරීම .................................. අභිනයට අයත් ය.

(08) ''සිරිසඟබෝධි මාලිගාවේ දී'' යන ගීතය ................................ නූර්තියේ එන ගීතයකි.

(09) කිසියම් බැගැරුම් අවස්ථාවකට මුහුණ දුන් විට සිය පාලනයෙන් තොරව සිදුවන ප්‍රතික්‍රියා නිරූපණය කිරීම ................................ අභිනයයි.

(10) සිතින් යමක් සිතා අළුත් දෑ මැවීමට ඇති හැකියාව ................................ ශක්තියයි.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති වාක්‍යවලින් වැරදි වාක්‍ය තෝරන්න.

(11) (1) යම්කිසි නාට්‍යයක නළු නිළියන් විවිධ චරිත සඳහා අඳින ඇඳුම් රංග වස්ත්‍ර ලෙස හඳුන්වයි.
(2) මූලික වශයෙන් ම චරිතය හඳුනා ගැනීමට රංග වස්ත්‍ර උපකාරී වේ.
(3) රංග වස්ත්‍ර ඒ ඒ චරිතයට ගැලපෙන අයුරින් සකස් විය යුතු ය.
(4) සාමාන්‍ය ජීවිතයේ දී අඳින වස්ත්‍ර රංග වස්ත්‍රාභරණ වලට සමාන ය.

(12) (1) රංග අභ්‍යාස නළුවකු හෝ නිළියක අඛණ්ඩව පුරුදු පුහුණු විය යුතු ය.
(2) එමඟින් චිත්ත ඒකාග්‍රතාව ඇතිවේ.
(3) ආශ්වාසය ප්‍රාශ්වාස කිරීම තුළින් චිත්ත ඒකාග්‍රතාව ඇති නොවේ.
(4) චිත්ත ඒකාග්‍රතාව නිර්මාණකරණයට අත්‍යාවශ්‍යයි.

(13) (1) ඉතිහාස කථා නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගත හැක.
(2) ඓතිහාසික චරිත පදනම් කරගෙන නාට්‍ය නිර්මාණය කළ හැක.
(3) අපේ ඉතිහාස කථා ඇසුරින් වර්තමානය සකස් කර ගත යුතුවේ.
(4) ඉතිහාස කථා සමාජය ගොඩ නැංවීමට ඉවහල් වේ.

(14) (1) නාට්‍යය යනු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.
(2) වේදිකා නාට්‍යය සජීවි ගුණයෙන් යුක්ත ය.
(3) සංයුක්ත තැටියකින් නරඹන වේදිකා නාට්‍යයකින් සැබෑ නාට්‍ය රසය විඳිය හැකි ය.
(4) වේදිකා නාට්‍යය සාමූහික කාර්යයකි.

(15) (1) නාට්‍යෝචිත කතන්දරවලින් නාට්‍ය පෙළ රචනා කළ හැකියි.
(2) කතන්දර අසා මෙන් ම කියවා ද රස විඳිය හැක.
(3) කතන්දරවල ගැටුම් අවස්ථා ඇත.
(4) කතාන්දරයට මුලක් මැදක් අගක් නැත.

- අංක 16 සිට 20 දක්වා 'අ' කොටසට වඩාත් ම ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා යා කරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| (16) ශ්‍රව්‍ය මාධ්‍ය | චිත්‍රපටයෙනි. |
| (17) වෙස් මුහුණු | ගැමි නාටක |
| (18) නාට්‍යෝපකරණ | රංග භාණ්ඩ |
| (19) වීර පුරන් අප්පු | වේදිකා නාට්‍යයකි. |
| (20) ගජමන් පුවත | ගුවන්විදුලිය |

## II කොටස

- පළමුවන අනිවාර්ය ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) (1) "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍යයේ රචකයා නම් කරන්න. (ලකුණු 02)

(2) එම නාට්‍යයේ තේමාව ලියා දක්වන්න. (ලකුණු 02)

(3) එම නාට්‍ය පෙළෙහි දැකිය හැකි නාට්‍යමය අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) නාට්‍යයේ චරිත හතරක නම් ලියන්න. (ලකුණු 02)

(5) අමරගේ මානසික අවශ්‍යතාවය ඉටුකර ගැනීමට ඔහු අනුගමනය කරන ක්‍රියා පිළිවෙළට අදාල එක් සිදුවීමක් ලියන්න. (ලකුණු 02)

(02) (1) රංග භූමිය යනු කුමක් ද? (ලකුණු 03)

(2) රංග භූමි තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) රංග භූමියක ලක්ෂණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(03) වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙට කල් නොදමන්නේ
.....................................................................

(1) මෙම කවියේ අවසාන පදය ලියන්න. (ලකුණු 03)

(2) මෙම කවිය උපුටාගත් මුල් කෘතිය කුමක් ද? (ලකුණු 03)

(3) ඉහත කවියෙන් ගත හැකි ආදර්ශය ලියන්න. (ලකුණු 04)

(04) (1) වෙස් මුහුණු හා මකුට සැකසීමේ දී භාවිතා කළ හැකි ද්‍රව්‍ය 03ක් ලියන්න. (ලකුණු 03)

(2) වෙස් මුහුණු හා මකුට රූපණයට පිටුවහලක් වන්නේ කෙසේ ද? (ලකුණු 03)

(3) ඔබ නිර්මාණය කළ වෙස් මුහුණක් (හැඟීම් ප්‍රකාශ වන ලෙස) ඇඳ දක්වන්න. (ලකුණු 04)